**13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය 9 වන සතිය - ජූනි 29 සිට ජූලි 03 දක්වා**

**නිපුණතා මට්ටම 11.2 - තනි විචල්‍යයක සාපේක්ෂ වෙනස මැනීම සඳහා සරල සාපේක්ෂ දර්ශක භාවිත කරයි.**

**සරල සාපේක්ෂ දර්ශක -**

පදනම් කාලච්ඡේදයකට සාපේක්ෂව සලකා බලන කාලච්ඡේදයේදී කිසියම් විචල්‍යයක වෙනස් වීම මැනීම සඳහා භාවිත කරන දර්ශක සරල සාපේක්ෂ දර්ශක නම් වේ.

සරල සාපේක්ෂ දර්ශක තුන් ආකාරයකට මැනිය හැකිය.

1.සරල මිල සාපේක්ෂකය

2.සරල ප්‍රමාණ සාපේක්ෂකය

3.සරල අගය සාපේක්ෂකය

**1.සරල මිල සාපේක්ෂකය**

දී ඇති කාලච්ඡේදයකදී භාණ්ඩයක මිළ පාද කාලච්ඡේදයේදී එම භාණ්ඩයේ මිළට සාපේක්ෂව අනුපාතයක් හෝ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කිරීම සරල මිල සාපේක්ෂකය නම් වේ.

**2.සරල ප්‍රමාණ සාපේක්ෂකය**

දී ඇති කාලච්ඡේදයකදී එක් භාණ්ඩයක් මිළදී ගන්නා ප්‍රමාණය පාද කාලච්ඡේදයේදී එම භාණ්ඩය මිළදී ගන්නා ප්‍රමාණයට සාපේක්ෂව අනුපාතයක් හෝ ප්‍රතිශතයක් වශයෙන් ගණනය කිරීම සරල ප්‍රමාණ සාපේක්ෂකය නම් වේ.

**3.සරල අගය සාපේක්ෂකය**

දී ඇති කාලච්ඡේදයකදී එක් භාණ්ඩයක් සඳහා ගෙවන වටිනාකම පාද කාලච්ඡේදයේදී එම භාණ්ඩය සඳහා ගෙවන ලද වටිනාකමට සාපේක්ෂව අනුපාතයක් හෝ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කිරීම සරල අගය සාපේක්ෂකය නම් වේ.

අභ්‍යාස

1.සරල සාපේක්ෂක දර්ශකවල පවතින ගුණාංග 4ක් නම් කර පහදන්න.

2.වසර කිහිපයක මාළු මිල ගණන් (1kgක) පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.එය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න.

| වර්ගය | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| තෝරා | 200 | 350 | 500 |
| පරා | 150 | 200 | 400 |
| බලයා | 100 | 300 | 400 |

එක් එක් මාළු වර්ගයේ මිල වෙනස්වීම ගණනය කර පිළිතුර පැහැදිලි කරන්න.